අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

# බුද්ධ ධර්මය

## විෂය නිර්දේශය

( 2009 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

ආගම් දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# 1.0 හැඳින්වීම

අධ්‍යාපන සංවර්ධනයේ දී විෂය මාලාවට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ජාතික අවශ්‍යතාවලට ගැළපෙන අයුරෙන් විෂයමාලා වෙනස් කිරීම කාලීනව සිදුවේ. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6-11 ශ්‍රේණිවල සිසුන්ට 2007 වර්ෂයේ සිට හඳුන්වා දෙනු ලැබූ බුද්ධ ධර්මය විෂය ඉගෙනීම තුළින් බුදු දහමේ ප්‍රධාන ඉගැන්වීම්, ශාසනික ඉතිහාසය හා බෞද්ධ සංස්කෘතික පසුබිම යටතේ අදාළ ශ්‍රේණිවලට ප්‍රමාණවත් වන පරිදි කරුණු හැදෑරීමට අවස්ථාව සලසන ලදී. එය නිපුණතා පාදකව සිදුවුණි.

එම අරමුණු ඉටුකර ගනිමින් අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සමත්ව අ.පො.ස. (උ.පෙළ) පන්තියට ඇතුළත් වන ශිෂ්‍යයා බුද්ධ ධර්මය විෂය හැදෑරීමෙන් බෞද්ධාගමික මූලික ඉගැන්වීම, සදාචාරය, සංස්කෘතිය පිළිබඳ විමර්ශනාත්මක, විචාරශීලී ගවේෂණයකට වැඩි දුරටත් යොමු වීමක් බලාපොරොත්තු වේ. එමගින් 6-11 ශ්‍රේණිවල ලබා ගත් බුද්ධ ධර්මය විෂය නිපුණතා වඩාත් සුවිශේෂී තත්ත්වයකට පත් කර ගැනීමට අවස්ථාව සැලසෙනු ඇත.

පැවති බුද්ධ ධර්මය විෂය නිර්දේශයට වඩා, හඳුන්වා දෙනු ලබන මෙම නිපුණතා පාදක විෂය අන්තර්ගතය ශිෂ්‍ය මිත්‍රශීලී වන ආකාරයට ඉදිරිපත් කරන්නට කටයුතු කර ඇත. එබැවින් වැඩි ශිෂ්‍ය පිරිසක් වඩාත් රුචිකත්වයෙන් යුතුව විෂය හැදෑරීමට පෙළඹෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අසා දැන ගැනීමට වඩා තමා විසින් ම කරුණු එක්රැස් කිරීම, ඒවා බෙදා විග්‍රහ කිරීම, එම කරුණුවල අන්තර්ගතය භාවිතයට ගැනීම පිළිබඳ අවබෝධය ශිෂ්‍යයාට ලැබෙන පරිදි විෂය නිර්දේශයේ කරුණු ක්‍රියාවට නැගිය යුතු වේ. එහිදී පහත සඳහන් කරුණු ද තහවුරු වනසේ ක්‍රියා කිරීම අපේක්ෂිතය.

නිපුණතා සියල්ල සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය විෂය දැනුමෙන්, ආකල්ප වලින්, කුසලතාවන්ගෙන් හා ජීවන යහපුරුදු වලින් පිරිපුන් මනා බෞද්ධ පෞරුෂයකින් හෙබි ඉගෙනුම් ලාභියෙකුගේ බිහිවීම බලාපොරොත්තු වේ.

## 2.0 විෂය අරමුණු

යහපත් වූ සමාජයක් තුළින්, වඩාත් ගෞරවනීය ජීවිතයක් ගොඩ නගා ගැනීම උදෙසා බුද්ධ ධර්මය විෂය ඉගෙනීම - ඉගැන්වීම කළ යුතු වේ. බුද්ධ ධර්මය විෂය පාසල් විෂය මාලාවට ඇතුලත් කර ඇත්තේ ලෞකික දියුණුව සහ ලෝකෝත්තර දියුණුව සඳහා ප්‍රගුණ කළ යුතු ජීවන ප්‍රතිපදාවක් බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළින් ඉදිරිපත් කිරීමේ අපේක්ෂාවෙනි.

එම අපේක්ෂාවන් ඵලදායක කරගනු සඳහා පහත සඳහන් විෂය අරමුණු ඇතුලත් ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම වැදගත් වේ

- ථෙරවාදී බුද්ධ ධර්මයෙහි ඉගැන්වෙන මූලික ධර්ම කරුණු වඩාත් විමර්ෂණශීලී ව අධ්‍යයනය කර චරිතායනය කර ගැනීම.
- බුද්ධ චරිතය සහ තෙරුවන් ගුණ ඇසුරින් බෞද්ධ පෞරුෂය ගොඩනගා ගැනීම.
- බෞද්ධ ආචාර ධර්ම පුද්ගල සහ සමාජ ප්‍රගතිය උදෙසා පවත්වා ගෙනයාම.
- ශාසන ඉතිහාසය ගවේෂණශීලී ව හදාරා ශාසන සංරක්ෂණයට දායකවීම.
- පුද්ගලයාගේ ලෞකික අර්ථ සිද්ධිය හා රාජ්‍ය පාලනය සඳහා වූ බෞද්ධ ඉගැන්වීම් අධ්‍යයනය කරමින් තෘප්තිමත් පුද්ගල, සමාජ රටාවක් ගොඩනගා ගැනීම.
- පුද්ගල යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව මනා දැනුවත්භාවයකින් යුක්ත වීම.
- මානව හිතවාදී ව හා මානව හක්තියෙන් යුතුව පරමාදර්ශී සමාජයක් බිහිකිරීම සඳහා දායක වීම.
- දයාව, කරුණාව, මෛත්‍රියෙන් පෝෂිතව අන්‍යෝන්‍ය සම්බන්ධතා වඩාත් වර්ධනය කර ගනිමින් සමාජයට හිතකර තැනැත්තෙකු වීම.

## විෂයය නිර්දේශය පාසල් වාර වශයෙන්
## බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2, 1.3<br>2.1 | 100 |
| | II | 2.2<br>2.3,<br>3.1,<br>3.2, | 100 |
| | III | 4.1,<br>4.2<br>5.1 | 100 |
| 13 | I | 6.1,6.2,6.3<br>6.4 | 100 |
| | II | 7.1 ,7.2<br>8.1, 8.2, | 100 |
| | III | 8.3<br>9.1<br>9.2,9.3<br>10.1,10.2,10.3 | 100 |

## 3.0 විෂය නිර්දේශය

### 3.1 - 12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේදගණන |
|---|---|---|---|
| 1.0 ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායයේ එන සිද්ධාර්ථ ගෞතම සම්බුද්ධ චරිතය විමර්ශනාත්මකව හදාරමින් ආදර්ශ ලබා ගනියි. | 1.1 බුද්ධ චරිතයෙහි අසම - සම බව හඳුනාගෙන ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි. | • සමකාලීන මහණ බමුණන් අතර බුදුරජාණන් වහන්සේගේ විශේෂත්වය<br>• බුදුරජාණන් වහන්සේගේ ආශ්චර්යවත් මනුෂ්‍යත්වය<br>• බුදුරජාණන් වහන්සේගේ රූපකායයෙහි විශේෂතා<br>• බුදුරජාණන් වහන්සේගේ විශිෂ්ට දේශනා විලාසය සහ ඉගැන්වීම් ක්‍රම | 35 |
| | 1.2 රහතන් වහන්සේට වඩා බුදුරජාණන් වහන්සේ තුළ ඇති විශේෂතා හඳුනා ගනියි. | • නව අරහාදි බුදුගුණ සවිස්තරව<br>• මහා කරුණාව හා මහා ප්‍රඥාව<br>• රහතන් වහන්සේට නොමැති බුදුරජාණන් වහන්සේට පමණක් ඇති ඤාණ | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- |
| | 1.3 පෞරුෂ වර්ධනය සඳහා සම්බුද්ධ චරිතාදර්ශ ලබා ගනියි. | • බුදුරජාණන් වහන්සේගේ ගවේෂණශීලිත්වය හා විමර්ශනශීලිත්වය<br>• සමානාත්මතාව සහජීවනය හා අන්‍යයන්ට සවන්දීම<br>• යථාවාදී තථාකාරීත්වය සහ යථාකාරී තථාවාදිත්වය<br>• තාදි ගුණය හා පද්මාකාර ජීවිතය | 30 |
| 2.0 බුද්ධ භාෂිත ශ්‍රී සද්ධර්මයෙහි සුවිශේෂතා අගය කරයි. | 2.1 බුද්ධ ධර්මයෙහි සුවිශේෂ ගුණ දැක සැදැහැවත් බව ඇති කරයි. | • ස්වාක්ඛාතාදී සවැදෑරුම් දහම් ගුණවලින් හෙළිවන සුවිශේෂතා | 10 |
| | 2.2 බුද්ධ ධර්මයෙහි සුවිශේෂ ලක්ෂණ හා එහි ප්‍රායෝගික අගය දැක වර්තායනය කරයි. | • බුදු දහම දේව අනාවරණයක් නොවීම<br>• බුදු දහම ආත්මවාදයක් නොවීම<br>• සිතා විමසා බලා පසක් කළ යුතු දහමක් වීම<br>• බුදු දහමෙහි විශ්ව සාධාරණ බව මෙන්ම මධ්‍යම දේශනාවක් හා මධ්‍යම ප්‍රතිපදාවක් වීම | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 2.3 බුද්ධ ධර්මයෙහි ප්‍රකටවන උභයාර්ථ සාධන ලක්ෂණ ආදර්ශයට ගනියි. | • මෙලොව හා පරලොව දියුණුව අවධාරණය කිරීම හා තමන් පිළිබඳවත් අන්‍යයන් පිළිබඳවත් දියුණුව අවධාරණය කිරීම. | 15 |
| 3.0 සංඝ සමාජයේ පරමාර්ථ සහ ප්‍රතිපත්ති විමර්ශනය කොට ඉන් ආදර්ශ ලබමින් එහි චිරස්ථිතියට දායක වෙයි. | 3.1 සංඝ සමාජයේ ආරම්භය, බුද්ධ කාලීන විකාශය සහ සහගුණ හදාරමින් ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි. | • ප්‍රාග් බෞද්ධ පබ්බජ්ජා සංකල්පය<br>• බුදු සසුනේ ඉගැන්වෙන පබ්බජ්ජාව සහ එහි ප්‍රභේද<br>• සාමණේර සීලය හා උපසම්පදා සීලය<br>• "සුපටිපන්නෝ ..." පාඨයේ නව වැදෑරුම් සහ ගුණ | 35 |
| | 3.2 සංඝ සමාජයේ පරිපාලනය හා සිව්පස පරිභෝග ක්‍රමය හැදින සමාජය තුළ සාමූහිකව ක්‍රියා කරයි. | • ආරාම ප්‍රතිග්‍රහණය, ශික්ෂාපද පැනවීම හා සාංඝික දේපල ක්‍රමය<br>• විනය කර්ම හා ගුරු සිසු සබඳතා | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 4.0 භාරතීය බෞද්ධ ධර්ම සංගායනා අධ්‍යයනය කරමින් ශාසන ආරක්ෂාවටහා ශාසන උන්නතියට කැප වෙයි. | 4.1 බුදු රදුන් ධරමාන සමයෙහි ධර්ම විනය ආරක්ෂා කර ගැනීම සඳහා යොදන ලද විධි විධාන අධ්‍යයනය කරයි. | • ශ්‍රාවක- ශ්‍රාවිකා අග තනතුරු පිරිනැමීම, ධර්මධර, විනයධර, සූත්‍රධර ආදී විශේෂ තෙරුන් පත් කිරීම<br>• ශ්‍රාවක ශ්‍රාවිකාවන් ධර්ම ප්‍රචාරයෙහි උනන්දු කරවීම. | 22 |
| | 4.2 බෞද්ධ චින්තනයේ පෝෂණයට හා ව්‍යාප්තියට ධර්ම සංගායනාවලින් සැලසුණු සේවය අගය කරමින් ශාසන චිරස්ථිතිය සඳහා ක්‍රියා කරයි. | • ප්‍රථම, ද්විතීය හා තෘතීය සංගායනා<br>• බුද්ධානුබුද්දක ශික්ෂා විනිශ්චය<br>• ධර්මය පිටක වශයෙන් බෙදීම සහ භාණක ක්‍රමය ආරම්භ කිරීම<br>• මූලික බුදු දහම වෙනස් නොකොට ආරක්ෂා කිරීම සහ දුර්මත ඛණ්ඩනය සඳහා ගත් ක්‍රියා මාර්ග<br>• නවරට සසුන් පිහිටුවීම. | 42 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 5.0 පාලි ත්‍රිපිටකයේ සැකැස්ම හැඳින ධර්මය හැදෑර්මෙහි ක්‍රමවත් බව ඇති කරගනියි. | 5.1 පාලි ත්‍රිපිටකයේ සැකැස්ම හදාරා එහි අන්තර්ගතය සැකෙවින් හැඳින ගනියි. | • විනය, සූත්‍ර, අභිධර්මය සහ අටුවා යන පද නිර්වචනය<br>• විනය පිටකයේ සැකැස්ම<br>• සූත්‍ර පිටකයේ සැකැස්ම<br>• අභිධර්මය පිටකයේ සැකැස්ම | 36 |

## 3.2 - 13 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 6.0 බුදු දහමෙහි අන්තර්ගත සත්ත්වයා සහ සමාජය පිළිබඳ ව ඉගැන්වීම් ඇසුරෙන් යථාර්ථය දකියි. | 6.1 බුද්ධකාලීන ශ්‍රමණ, බ්‍රාහ්මණ සම්ප්‍රදායවල එන සත්ත්වයා සහ සමාජය පිළිබඳ ඉගැන්වීම් හඳාරයි. | • පුද්ගලයා හා සමාජය පිළිබඳ බ්‍රාහ්මණ ඉගැන්වීම්<br>• පුද්ගලයා හා සමාජය පිළිබඳ ෂට් ශාස්තෘන්ගේ ඉගැන්වීම් | 21 |
| | 6.2 විශ්වය සහ සමාජය පිළිබඳ ව බෞද්ධ ඉගැන්වීමේ බුද්ධිගෝචර බව පිළිගනියි. | • විශ්වයේ ස්වභාවය<br>• සමාජයේ ප්‍රභවය සහ විකාශය<br>• විශ්වය සහ සමාජය පිළිබඳ බෞද්ධ ඉගැන්වීමෙහි බුද්ධි ගෝචර බව | 26 |
| | 6.3 ත්‍රිලක්ෂණ දර්ශනය හා අටලෝ දහම දැක සචලවත් හා තෘප්තිමත් ජීවිතයක් ගත කරයි. | • නිත්‍යය, සැපය, ආත්මයැ'යි සැලකීම ලෝක ස්වභාවය වන බව<br>• අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් සැලකීම<br>• ත්‍රිලක්ෂණය<br>• ත්‍රිලක්ෂණ ධර්මයෙන් හා අටලෝ දහමෙන් ගොඩනැගෙන ජීවන දර්ශනය | 28 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 6.4 බුදු දහම ඇසුරෙන්, ජීව අජීව පරිසරය සමඟ පුද්ගලයාගේ සම්බන්ධය දැක පරිසරයට හිතකාමී ව හැසිරෙයි. | • ජීව පරිසරය විෂයෙහි දැක්විය යුතු ආකල්පය සහ ගතයුතු ක්‍රියාමාර්ග<br>• අජීව පරිසරය විෂයෙහි දැක්විය යුතු ආකල්පය සහ ගතයුතු ක්‍රියාමාර්ග<br>• අන්තර් පුද්ගල සම්බන්ධතා | 25 |
| 7.0 සත්‍යය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ඇසුරෙන් තම ජීවන දර්ශනය ගොඩනගා ගැනීමට ක්‍රියා කරයි. | 7.1 චතුරාර්ය සත්‍යයෙන් ප්‍රකට වන දර්ශනය ගැටලු විසඳීමෙහි ලා උපයෝගී කර ගනියි. | • දුක පිළිබඳව සහ දුක්ඛ සමුදය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්<br>• දුක්ඛ නිරෝධය සහ ඒ පිළිබඳ ප්‍රතිපදාව<br>• දුක්ඛ සංකල්පයෙන් සැපය නිෂේධනය නොවන බව<br>• ආර්ය අෂ්ටාංගික මාර්ගය හා ත්‍රිශික්ෂාව<br>• ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ලෞකික හා ලෝකෝත්තර උපයෝගීතාව | 32 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 7.2 සන්තානගත දුක සහ සංස්ථාගත දුක ඇතිවන අයුරු දැන යහපත් සමාජ ජීවිතයකට හා නිවන් මගට යොමු වෙයි. | • සන්තානගත දුක ගොඩනැගෙන අයුරු සහ සංස්ථාගත දුක ගොඩනැගෙන අයුරු<br>• ශාස්වත උච්ඡේද දෘෂ්ටි හා පටිච්ච සමුප්පාදය<br>• කාම සුඛල්ලිකානු යෝගය, අත්තකිලමතානුයෝගය සහ මධ්‍යම ප්‍රතිපදාව | 22 |
| 8.0 බුදු දහමෙහි එන මානව කේන්ද්‍රීය බව තේරුම් ගෙන මානසික ශක්‍යතාව වර්ධනයෙහි නිරත වෙයි. | 8.1 මිනිසා පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් අනුව ඔහුගේ කාය ශක්තිය ඉක්මවා මානසික ශක්තිය ව්‍යාප්ත වන අයුරු දැක තම විභව්‍යතා සංවර්ධනය කර ගනියි. | • බුදු දහම මිනිසා සතු කායික මානසික යන උභය ශක්තියම අගය කරන බව<br>• මිනිසාගේ ස්වාමිත්වය සහ ශ්‍රේෂ්ඨත්වය<br>• වගකීම, නිදහස සහ ස්වච්ඡන්දතාව | 20 |
| | 8.2 මානව ශක්‍යතා වර්ධනයට බෞද්ධ භාවනාව උපයෝගී වන බව පිළිගෙන භාවනාවෙහි යෙදෙයි. | • සමථ, විපස්සනා භාවනා<br>• භාවනාව හා ආධ්‍යාත්මික සංවර්ධනය<br>• භාවනාව හා දෛනික ජීවිතය<br>• භාවනාවේ උපයෝගීතාව පිළිබඳ නූතන ඇගයීම් | 26 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| | 8.3 කර්මය, පුනර්භවය සහ විමුක්තිය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් හැඳින ප්‍රඥාවෙන් සහ වීර්යයෙන් ක්‍රියා කරයි. | • කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම<br>• කුසලාකුසල කර්ම විනිශ්චය කිරීමේ බෞද්ධ මිනුම් දඬු<br>• කර්මය හා පුනර්භවය අතර ඇති සම්බන්ධය<br>• සංසාර විමුක්තිය තමාගේ වීර්යයෙන් හා අධිෂ්ඨානයෙන් කටයුතු කර සලසා ගත හැකි බව. | 25 |
| 9.0 බෞද්ධ ආචාර ධර්ම උපයෝගී කර ගනිමින් ජීවිතය හැඩගසා ගනියි. | 9.1 බෞද්ධ ආචාර ධර්ම හා ශ්‍රද්ධාව අතර සබඳතාව හැඳින ශ්‍රද්ධාවෙන් ක්‍රියා කරයි. | • භක්තිය , ප්‍රේමය හා බෞද්ධ ශ්‍රද්ධාව<br>• අමූලිකා සද්ධා, ආකාරවතී සද්ධා | 15 |
| | 9.2 ශික්ෂණය පිළිබඳ ඉගැන්වීම් පිළිපදිමින් සිල්වත් ආචාරශීලී හා පුණ්‍ය කාමී ජීවිතයක් ගොඩනගා ගනියි. | • පන්සිල් , අටසිල්,ආජීව අෂ්ටමක සිල්, දස සිල්<br>• දස කුසල් හා දස පුණ්‍යක්‍රියා | 15 |
| | 9.3 සාධාරණත්වය තහවුරු වන බෞද්ධ සමාජ ධර්ම ක්‍රියාවට නගයි. | • සතර අගතියෙන් වෙන්වීම<br>• සතර සංග්‍රහ වස්තු<br>• සතර බ්‍රහ්ම විහරණ | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|
| 10. බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය තේරුම් ගෙන ඒ අනුව ක්‍රියා කරයි. | 10.1 ආර්ථික සුරක්ෂිතතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් දැන තුලනාත්මක ජීවන රටාවක් හැඩගසා ගනියි. | • ආර්ථික සුරක්ෂිතතාව පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | 10 |
| | 10.2 ඉපයීම හා පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් දැන තෘප්තිමත්ව කටයුතු කරයි. | • ඉපයීම හා පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් | 10 |
| | 10.3 දේශපාලන ක්‍රියාකාරීත්වයට අදාළ බෞද්ධ ඉගැන්වීම් අවබෝධ කර යහපාලනයට උපකාර වේ. | • බෞද්ධ රාජ්‍යපාලන මූලධර්ම, දස සක්විතිවත් හා සප්ත අපරිහානිය ධර්ම | 10 |

# 4.0 ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

නව දැනුම, අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂය සොයා යන උසස් පෙළ සිසුන්ට බුද්ධ ධර්මය විෂය යටතේ පෘථුල අත්දැකීම් සම්භාරයක් ලබා ගනිමින් කරුණු සාක්ෂාත් කරගැනීමේ අධ්‍යාපනික පසුබිමක් සකසා දිය යුතු වේ.

දැනුම්, ආකල්ප,කුසලතා තුළින් ජීවිත යහ පුරුදු වඩාත් වැඩි වර්ධනය වන අයුරෙන්, බුදු දහමේ ඉගැන්වෙන අධ්‍යාපන ක්‍රම නූතන ශිෂ්‍ය පරම්පරාවේ ප්‍රගමණය උදෙසා යොදාගත හැකිනම් වඩාත් ඵලදායීවනු නොඅනුමාන ය. ඒ අතුරෙන් පැවරුම් ක්‍රමය, ප්‍රශ්නෝත්තර ක්‍රමය, ගවේෂණ ක්‍රමය, ශ්‍රව්‍ය දෘශ්‍ය ක්‍රමය, සංවාද ක්‍රමය, දේශනා ක්‍රමය භාවිත කළ හැකි ය. ශිෂ්‍යයා නව නිර්මාණශලී චින්තනයට යොමු කිරීම ශිෂ්‍ය ජීවිතයේ දී පමණක් නොව සාමාජයීය ජීවිතයේ දී ද වැදගත් වේ.

ශිෂ්‍යයාගේ මානසික මට්ටමට අනුරූපව ගනු ලබන ප්‍රවේශයෙන් අපේක්ෂිත මට්ටම් කරා සාධනීය අයුරෙන් සාර්ථකත්වයට පැමිණීම ගුරුභවතාගෙන් අපේක්ෂා කෙරේ. දත් දෙයින් ශිෂ්‍යයා ගවේෂණශීලී මාවතට යොමු කළ හැකි ය. මෙහි දී ගුරුභවතා ශිෂ්‍යයාට මග පෙන්වමින් තමා ද අධීක්ෂණයේ යෙදෙමින් දිරිගැන්වීම් කළ යුතු ය. මෙහි දී ගුරුවරයා තවදුරටත් මගපෙන්වන්නකු , සම්පත් දායකයකු බවට පත්වීම අනිවාර්ය වේ.

විෂයය උගන්වන ගුරුභවතා ගුරු භූමිකාව තුළ විවිධ ශිල්ප ක්‍රම අනුගමනය කරමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයට අනුගත වීමට නිදහස ඇත. තමාගේ ඉගැන්වීම් අත්දැකීම් හරහා ඉගෙනුම් ක්‍රම විධි සකස් කර ගන්නට ගුරුවරයාට හැකිවිය යුතු ය. විෂයය ඉගැන්වීමේ දී ගුරුභවතා විෂය විශේෂඥයකු විය යුතු ය. මෙසේ දැනුමින් පර්පූර්ණ ගුරුභවතකු වෙතින් ශිෂ්‍ය සාධනය පමණක් නොව ගුරු බැතිය ද වර්ධනය වනු ඇත.

පන්තියට පැමිණි ගුරුභවතා අදාළ පාඩමට පිවිසීම උදෙසා විවිධ ක්‍රම අවස්ථාවෝචිතව හා පාඩමට අනුරූපව සකසා ගැනීම තුළින් ශිෂ්‍ය අවධානය වඩාත් ඵලදායක අයුරෙන් යොදවා ගත හැකි ය. නාට්‍යානුසාරයෙන් ප්‍රශ්න විචාරාත්මකව, කවි - ගීත ගායනා ඉදිරිපත් කිරීම, ශ්‍රව්‍ය දෘශ්‍ය පට භාවිත කිරීම මගින් ශිෂ්‍ය අවධානය ඉතා දැඩිව ලබාගත හැකිවනු ඇත. එමගින් ශිෂ්‍යයා ප්‍රබෝධාත්මක මානසික තත්ත්වයකට පත්කළ හැකි වේ. සෑම අවස්ථාවක ම පාඩමක් සැලසුම් කිරීමේදී ශිෂ්‍ය ක්‍රියාකාරීත්වයට මුල්තැන ලැබෙන සේ කටයුතු කළ යුතු ය. ශිෂ්‍ය දක්ෂතා ඔප් නැංවෙන අයුරෙන් සැලසුම් සැකසීම අවශ්‍යම ය.
දීර්ඝ සටහන්දීමට වඩා විෂය කරුණු ගොනු කර ගැනීමේ හැකියාවත් ඒවා නැවත නිවැරදි ලෙස ලිඛිතව දැක්වීම සඳහා වූ හුරුවත් ශිෂ්‍යයාට ලබා දීමට ක්‍රියා කළ යුතු ය. මේ මගින් ලිවීමේ දුර්වලතා මගහරවා ගැනීමට ද හැකිවනු ඇත.

ශිෂ්‍යයන් අතර ප්‍රමුඛයන් - ප්‍රධානයන් නම් කිරීමට ගුරුභවතා උත්සුක නොවිය යුතු ය. නායකත්වය, මූලිකත්වය ශිෂ්‍යයන් තුළින් ම ගොඩ නංවා ගැනීමට අවස්ථාව දිය යුතු ය. ශිෂ්‍යයාගේ සැඟවුණ හැකියා විෂයානුසාරයෙන් සමාජගත කරන්නට ගුරුභවතා සමත්විය යුතු ය. ශිෂ්‍යයාට වගකීම් භාරගෙන කටයුතු කිරීමේ අවස්ථාව නිරන්තරයෙන් ම හිමිකරදීමත් විෂය සමගාමීව, ක්ෂේත්‍ර චාරිකා, කණ්ඩායම් ව්‍යාපෘති මගින් ඉගෙනුම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට පහසුකම් සලසාදීමත් ගුරුභවතාගේ වගකීම වේ.

කිසියම් විෂය බද්ධ කොටසක්, විෂය පිළිබඳ විශාරද දැනුමක් - ප්‍රවීණතාවක් ඇති සම්පත් දායකයකු මගින් ලබාදීම ද, අවශ්‍යතාව මත ඉටු කිරීමට ගුරුභවතාට නිදහස ඇත.
මෙසේ කටයුතු කිරීමෙන් විෂය දැනුමින් පමණක් නොව ආකල්ප, කුසලතා හා යහ පුරුදුවලින් පර්පූර්ණ ශිෂ්‍ය ප්‍රජාවක් තනා සමාජයට යොමු කිරීමේ, දායාද කිරීමේ කාර්ය භාරයට දායක වන්නට ගුරුභවතාට හැකි වේ. ශිෂ්‍යයාද ප්‍රබෝධාත්මක නව නිර්මාණශීලී කෙනකු බවට පත්වනු ඇත.

# 5.0 පාසල් ප්‍රතිපත්ති සහ වැඩ සටහන්

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අවධියේ ශිෂ්‍යයා බුද්ධ ධර්මය විෂය පිළිබඳ අදාළ නිර්දේශ අනුව දැනුමක් ලබා ඇත. මූලික ධර්ම කරුණු, සාමාජික,සංස්කෘතික හා දේශපාලන යන කරුණු ඔස්සේ වඩාත් පුළුල්ව අධ්‍යයනය කිරීමක් බුද්ධ ධර්මය විෂයය යටතේ අ.පො.ස. (උ.පෙළ) සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කළ යුතු වේ.

බෞද්ධ ඉගැන්වීම්වල ජීවිතයේ ගැඹුරු ධර්ම කරුණු මෙන්ම සරල බාහිර පැත්තක් ද ආචාර විද්‍යාත්මක කරුණු ද ඇතුළත්ව පවතී. බෞද්ධ අධ්‍යාපනයේ විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල් ය. ගැඹුරු ය.

ගුරුභවතාගේ කාර්යභාරය වන්නේ දැකීම හා එසේ වීමට කියා දීම (ආචික්ඛනා) දේශනා කිරීම, (දේශනා) පැනවීම ( පඤ්ඤපනා) පිහිටුවීම (පට්ඨපනා) විවරණය කිරීම (විවරණා) බෙදා දැක්වීම (විභජනා )එළි පැහැදුම් කොට දැක්වීම (උත්ථානි කම්ම) ලෙස බුදු දහමෙහි දැක්වේ. නිපුණතා පාදකව වූ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යාවලියේ දී නිපුණතාවට ළඟාවීම උදෙසා මෙම කරුණු උපයෝගී කරගත හැක. නියුක්තිකරණය, ගවේෂණය, විවරණය, විස්තාරය, තක්සේරුව හා ඇගයීම මෙම කරුණු ඔස්සේ විද්‍යමාන වේ.

දත් දෙයින් නොදත් දෙයට යාම බෞද්ධ ඉගැන්වීම වන අතර නූතන අධ්‍යාපන විද්‍යාවේ ද එය පිළිගෙන ඇත. ගුරුභවතා මග කියන්නෙක් මෙන්ම අධීක්ෂකයෙක් ද වන අතර ශිෂ්‍යයාට ඉගෙනුම සඳහා පහසුකම් සලසන්නා ද වේ. බුදු දහමෙහි මෛත්‍රිය , කරුණාව , දයාව වැනි උසස් ආකල්ප වර්ධනය කිරීමටත්, බුද්ධි වර්ධනය, විමංශනය, තර්කණය, පරිකල්පන ශක්තීන් අවධාරණය කිරීමටත් සුදුසු පරිදි විෂය නිර්දේශය සකස් කර ඇත. ශිෂ්‍යයාගේ ආකල්ප වඩා වර්ධනය වීමට අවශ්‍ය පරිසරය ගුරුභවතා විසින් ලබා දිය යුතු ය.

මෙහි දී මෙම විෂයය උගන්වන ගුරුභවතා බෞද්ධයකු වීම අනිවාර්ය විය යුතු අතර, ඔහු/ ඇය විෂය විශේෂඥයකුවීම අවශ්‍ය වේ. එමෙන්ම ආගමික ප්‍රතිපත්ති සුරකින, ගරු කරන , ආගමික හැදියාවකින් යුක්ත අයකු වීම අත්‍යවශ්‍ය ය. විෂය ඉගැන්වීමේ දී සුදුසු පරිදි පන්ති වටපිටාව සකස් කර ගැනීමට ගුරුවරයාට මෙම කරුණු උපකාරවත් වේ.

බෞද්ධ ආගමික සංසදයක් ආරම්භ කොට ඒ මගින් ශිෂ්‍ය දක්ෂතා, හැකියා , ඔප් නංවන්නට කටයුතු සැලසුම් කළ යුතු ය. මේ මගින් බෞද්ධාගමික සාරධර්ම සම්බන්ධ වූ භාවනා, පිරිත්, ධර්ම සාකච්ඡා, ධර්ම දේශනා, දානමය පින්කම් සංවිධානය කිරීමට ගුරුභවතා විසින් ශිෂ්‍යයා යොමු කළ යුතු වේ. මෙම කරුණුවලට අමතරව බුද්ධි මණ්ඩල සාකච්ඡා, වාර ප්‍රකාශන, ක්ෂේත්‍ර චාරිකා , අධ්‍යාපන චාරිකා සැලසුම් කළ යුතු වේ.

මෙම අවස්ථාවලින් ලබන අත්දැකීම් ඔස්සේ ශිෂ්‍යයාගේ දැනුම, ආකල්ප, කුසලතා වර්ධනයට සහ යහපත් ජීවන දර්ශනයක් ගොඩ නැංවීමට අවශ්‍ය යහ පුරුදු ගොඩ නැගීමට හැකි වන සේ සැලසුම් සැකසිය යුතු ය.

පාරිසරික සංරක්ෂණයට අදාළ වන ගෙවතු වගා, පාසල් භූමි අලංකරණය, ජල සංරක්ෂණය හා කළමනාකරණය , වන වගා ව්‍යාපෘති සඳහා ශිෂ්‍ය දායකත්වය ලබා ගත යුතු ය. පරිසරය සුරක්ෂිත කිරීමේ ඇති වටිනාකම ශිෂ්‍යයන්ට ලබාදීමට මෙම වැඩ පිළිවෙල වැදගත් වේ. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීයව සැලසුම් සකස් කිරීම ගුරුභවතාගේ වගකීමකි. මෙහි දී බෞද්ධාගමික ඉගැන්වීම් ඉස්මතු වන පරිදි සැලසුම් කිරීමට අමතක නොකිරීම වැදගත් වේ.

පාසල පදනම් කරගත් ක්‍රියාවන්හිදී සෑම අවස්ථාවක ම සටහන් තබා ගැනීමට ශිෂ්‍යයා යොමු කිරීම තුළින් වඩාත් ක්‍රමවත් ව නිරවුල් ව කටයුතු කිරීමේ අවස්ථාව සලස්වා දිය හැකි ය. මෙම කරුණු සැකසීමේ දී වාර්ෂිකව සැලසුමක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම වඩාත් ඵලදායක වනු ඇත.

වසර දහ තුනක් තිස්සේ ලත් ආගමික අධ්‍යාපනය මත වැඩදායක පුරවැසියකු සමාජයට උරුම කිරීමට හැකි අයුරෙන් පාසල් ප්‍රතිපත්ති හා ඒ හා අදාළ වැඩ සටහන් සම්පාදනය වීම වැදගත් ය.

# 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් - ඇගයීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතය.

13 වන ශ්‍රේණිය අවසානයේදී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. (උ.පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිතය.

මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2011 වර්ෂයේ දී පැවැත්වේ.

මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.